**<u>ඌව පළාත් සහා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම - 2024</u>**

ඌව පළාතේ පළාත් සහා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ඌව පළාතේ ස්ථිර පදිංචි මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත අධ්‍යාපනවේදී උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2024.03.15** දින වේ.

**01. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

1.1 අයදුම්කරු/අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

1.2 අයදුම්කරු/අයදුම්කාරිය ඌව පළාතේ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඇති පුරවැසියෙකු විය යුතුය. (පූර්වාසන්න වසර තුනක පදිංචිය සනාථ කරන ඡන්ද හිමි නාමලේඛන උධෘත සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ඌව පළාතේ ස්ථිරව පදිංචිව සිටින එහෙත් ඌව පළාතේ වසර 03ක පූර්වාසන්න ස්ථිර පදිංචිය තහවුරු කළ නොහැකි අයදුම්කරුවන් ඌව පළාත තුළ තම කලත්‍රයාගේ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.)

1.3 යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.4 **2024.03.15** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

**02. අධ්‍යාපන සුදුසුකම් :-**

2.1 අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.2.1 වගන්තියේ සටහන 6 ප්‍රකාරව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබීම.

2.2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින්, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වලංගු වන පරිදි අධ්‍යාපනවේදී උපාධියක් ලබා තිබිය යුතුය. එම උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයයන් වලට අනුකූලව මෙම නිවේදනයේ උපලේඛන අංක 01 යටතේ ඔබ අයදුම් කරන විෂයය හා විෂයය අංකය පැහැදිලිව සටහන් කළ යුතුය. මෙම නිවේදනය යටතේ අයදුම් කළ හැක්කේ උපලේඛන අංක 01 හි සඳහන් විෂයය පුරප්පාඩු සඳහා පමණි.

**03. සේවා කොන්දේසි :-**

3.1 මෙම තනතුර ස්ථිර ය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

3.2 මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

3.3 වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ වෙනත් පාසලකට ස්ථාන මාරුවීම් ලබා දීමට ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සලකා බලනු ඇත.

3.4 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

3.5 මෙම උපාධිධාරීන් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 - II ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, **2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016(iv) හි GE-2-2016 - ඒ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු. 39,175/- 825 x 10 – 1,335 x 7 – 1,630 x 20 – 89,370 /-** ක් වූ වැටුප් පරිමාණයේ තෙවන පියවර වන රුපියල් **40,825/-** ක මාසික වැටුප මත පිහිටවනු ලැබේ.

## 04. බඳවා ගැනීමේ ක්‍රමය :-

4.1 මෙම නිවේදනය යටතේ බඳවා ගනු ලබන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති පරිදි පුරප්පාඩු 40ක් සඳහා පමණි.

අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙහි සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතුරින් පිළිගනු ලබන අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් මෙම නිවේදනයේ 4.4 හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. අයදුම්කරු විසින් ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙලට පුරප්පාඩු 40ක් සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

4.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.4 **ප්‍රායෝගික පරීක්ෂණය : කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.**
**- උපරිම ලකුණු 25**

ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලේ. ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් නිර්ණායක පදනම් කොට ගෙන මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. අයදුම්කරු විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාලව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් නිර්ණායකයන් ඔස්සේ ලකුණු හිමි වේ. මෙම පරීක්ෂණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | නිර්ණායකයන්හි අරමුණ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ය වීම | සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිෂ්ය වීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම. | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | | 25 | 10 |

- ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් **ලකුණු 02** බැගින් ලබා ගත යුතුය.

4.5 එමෙන්ම මෙම බඳවා ගැනීමේ නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම කරුණු සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

## 05. අයදුම් කළ යුතු පිළිවෙල :-

5.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පතේ ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 06 දක්වා කොටස් පළමු පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් වන සේ අයදුම්පත සැකසිය යුතුය. විද්‍යුත් තැපැල් ලිපිනය නිවැරදිව සඳහන් කිරීම අනිවාර්යය වේ.

5.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.03.15** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **"ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ඌව පළාත් රාජ්‍ය සේවයේ ගුරු සේවයේ 2-II ශ්‍රේණියට අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම - 2024 "** යනුවෙන් සහ ඔබ අයදුම් කරන විෂයය හා විෂයය කේත අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

5.3 අයදුම්කරුවෙකුට එක් විෂයයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන විෂයය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. පුරප්පාඩු විෂයය ලේඛනය අනුව අයදුම් කරනු ලබන විෂයය, විෂයය කේත අංකය හා ඉගැන්වීමට අපේක්ෂිත මාධ්‍ය අයදුම්පතේ අදාල ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.4 එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලබන පාසල විෂයය පුරප්පාඩු අනුව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර, ඌව පළාතේ පුරප්පාඩු පවතින ඕනෑම පාසලක සේවය කිරීම සඳහා අයදුම්කරු එකඟ විය යුතු වේ.

5.5 අයදුම්පත සමග කිසිදු සහතිකයක් අමුණා නොඑවිය යුතුය. නියමිත ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත තැපෑලේදි නැති වීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**06. අත්සන සහතික කිරීම :**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු/සාමදාන විනිශ්වයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 47,615/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**07.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

**08.** එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ගුරු සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**10.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳ අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම/තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

## උපලේඛන අංක 01 - විෂයය පුරප්පාඩු ලේඛනය

| විෂයය කේත අං: | විෂයය | විෂයය කේත අං: | විෂයය |
|---|---|---|---|
| 1 | ප්‍රාථමික අධ්‍යාපනය | 32 | කෘෂි තාක්ෂණය |
| 2 | බුද්ධ ධර්මය | 33 | ජෛව සම්පත් තාක්ෂණය |
| 3 | බෞද්ධ ශිෂ්ටාචාරය | 34 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා |
| 4 | ඉස්ලාම් | 35 | රසායන විද්‍යාව |
| 5 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 36 | භෞතික විද්‍යාව |
| 6 | රෝමානු කතෝලික | 37 | ජීව විද්‍යාව |
| 7 | ක්‍රිස්තියානි | 38 | කෘෂි විද්‍යාව |
| 8 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 39 | සංයුක්ත ගණිතය |
| 9 | හින්දු ආගම | 40 | උසස් ගණිතය |
| 10 | හින්දු ශිෂ්ටාචාරය | 41 | ඉංජිනේරු තාක්ෂණවේදය |
| 11 | සිංහල භාෂාව | 42 | ජෛව පද්ධති තාක්ෂණවේදය |
| 12 | දෙවන භාෂවක් ලෙස සිංහල | 43 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව |
| 13 | ඉංග්‍රීසි භාෂාව | 44 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය |
| 14 | දෙමළ භාෂාව | 45 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය |
| 15 | දෙවන භාෂවක් ලෙස දෙමළ | 46 | අභ්‍යන්තර නිර්මාණකරණය |
| 16 | පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය | 47 | භූ දර්ශන නිර්මාණකරණය |
| 17 | භූගෝල විද්‍යාව | 48 | මොටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය |
| 18 | ගණිතය | 49 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| 19 | විද්‍යාව | 50 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| 20 | ඉතිහාසය (ඉන්දියානු/ යුරෝප/ සමකාලීන) | 51 | නිපැයුම්කරණය |
| 21 | ඉතිහාසය (අ.පො.ස සා/පෙ) | 52 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය |
| 22 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යාපනය | 53 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| 23 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | 54 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය |
| 24 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 55 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය |
| 25 | දේශපාලන විද්‍යාව | 56 | ප්‍රාසාංගික කලාව/නාට්‍ය හා රංග කලාව |
| 26 | ආර්ථික විද්‍යාව | 57 | කාර්යසිද්ධි කළමනාකරණය |
| 27 | ගිණුම්කරණය | 58 | සංචරණ හා ආගන්තුක සත්කාරය |
| 28 | ව්‍යාපාර අධ්‍යයනය | 59 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| 29 | තර්ක හා විද්‍යාත්මක ක්‍රමය | 60 | සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා |
| 30 | ගෘහ ආර්ථික විද්‍යාව | 61 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය |
| 31 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 62 | ළමා මනෝවිද්‍යාව හා ආරක්ෂණය |

කොමිෂන් සභාවේ නියමය පරිදි,

2024.03.04 වන දිනදීය.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 14/4, පීලිපොතගම පාර,
පිං අරාව, බදුල්ල.

(එච්.එම්. ජීවන්ත හේරත්)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

**ඌව පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම - 2024**

01. ඉල්ලුම් කරනු ලබන විෂයය හා ඉගැන්වීමට අපේක්ෂිත භාෂා මාධ්‍ය :
(උපලේඛන අංක 01 අනුව සඳහන් කරන් න)

| ඉගැන්වීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය | විෂයය | විෂයය කේත අංකය |
|---|---|---|
| | | |

02. 2.1 සම්පූර්ණ නම :.............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.............................................................................................................

2.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම : Rev/Mr/Mrs/Miss
:.............................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- HERATH A.M.N.

2.3 සම්පූර්ණ නම :.............................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්) .............................................................................................................

03. 3.1 ස්ථිර ලිපිනය :.............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .............................................................................................................

3.2 ස්ථිර ලිපිනය :.............................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්) .............................................................................................................

3.3 විද්‍යුත් තැපැල් ලිපිනය :.............................................................................................................
(සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ ලිපිය විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරන බැවින් නිවැරදිව සඳහන් කිරීම අනිවාර්යය වේ)

3.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0 | |

5.2 උපන් දිනය : අවුරුද්ද | | | | | මාසය | | | දිනය | | |

5.3 **2024.03.15** දිනට වයස : අවුරුදු | | | මාස | | | දින | | |

06. **2024.03.15** දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව : අවුරුදු | | මාස | | දින | |

07. අධ්‍යාපන සුදුසුකම් :-

7.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :

| | වර්ෂය :..................... | විභාග අංකය :..................... | | | |
|---|---|---|---|---|---|
| | විෂයය | සාමර්ථ්‍ය | | විෂයය | සාමාර්ථ්‍ය |
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

7.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| | වර්ෂය :..................... | විභාග අංකය :..................... |
|---|---|---|
| | විෂයය | සාමාර්ථ්‍ය |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

7.3 ලබාගෙන ඇති අධ්‍යාපනවේදී උපාධිය පිළිබඳ විස්තර :
(වලංගු දිනය සඳහන් කිරීම අනිවාර්යය වේ.)

| උපාධිය | ලබාගත් ආයතනය | වලංගු දිනය | හදාරා ඇති විෂයයන් | උපාධිය හදාරන ලද භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|
| | | | | |

---

**08. අයදුම්කරුගේ සහතිකය :**

................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව දනිමි. තවද, මෙම පත්වීම ලබා දීම සම්බන්ධයෙන් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය :............................................ ................................................

අයදුම්කරුගේ අත්සන

**09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................................. ලිපිනයේ පදිංචි ....................................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ....................................... වන දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද මෙයින් සහතික කරමි.

(අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය :.......................................

................................................ .............
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන අයගේ සම්පූර්ණ නම :.........................................................................................

තනතුර :.........................................................................................

ලිපිනය :.........................................................................................

.........................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)